පළාත් සැලසුම් චක්‍රලේඛ අංක -2021/01

මගේ අංකය - NCP/CS/PD/D/06/2

ප්‍රධාන ලේකම් කාර්යාලය

උතුරු මැද පළාත.

දිනය - 2021.12.10

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානින්,

ව්‍යවස්ථාපිත අධිකාරි ආයතන ප්‍රධානින් වෙත.

**<u>2022 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා උපදෙස්</u>**

2022 වර්ෂයට අදාළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදී පහත සඳහන් අරමුණුවලට අවධානය යොමු කරමින් කටයුතු කිරිම අපේක්ෂා කරන අතර, එහිදී අනුගමනය කළයුතු උපදෙස් මෙම චක්‍රලේඛයට ඇතුළත් කර ඇත.

i. සංවර්ධන අවශ්‍යතා නිසි පරිදි ප්‍රමුඛතාගත කිරිම.

ii. අරමුදල් යෙදවීම හා වියදම් කිරිම කාර්යක්ෂම කිරිම.

iii. මානව සම්පත ඵලදායීව අදාල කාර්යයන් වල යෙදවීම.

iv. ඉටුකරන ලබන ව්‍යාපෘතිවල විනිවිදභාවය උපරිම ලෙස පවත්වාගෙන යාම.

2. ඒ අනුව 2022 තුළ දී ක්‍රියාත්මක කිරිම සඳහා සංවර්ධන ව්‍යාපෘති තෝරාගැනිමේ දී හා තක්සේරු කිරීමේදි මුදල් කොමිෂන් සභාවේ FC/PDP/01/01/2022 අංක සහිත 2021.11.26 දින නිකුත් කර ඇති උපදෙස් සඳහන් ලිපියේ ආකාරයට ජාතික සංවර්ධන ප්‍රමුඛතා සැළකිල්ලට ගනිමින් සංවර්ධන සැලසුම් සැකසීමත් සංවර්ධන ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරිමත් සිදු විය යුතුය. එසේම FC/PDP/01/01/2021 අංක දරණ 2020.12.30 දින මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති 2021 වාර්ෂික සංවර්ධන සැලැස්ම සැකසිමේ මාර්ගෝපදේශය (Guidelines for Preparation of the Provincial Annual Development Plan) කෙරෙහි ද අවධානය යොමු කරමින් පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කළ යුතුය.

**<u>මූලධන, පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පහත ක්‍රමවේද හා නිර්ණායක අනුගමනය කළයුතු වේ.</u>**

I. 2021 වසරෙන් 2022 වසරට අවිච්ඡේද වියහැකි ව්‍යාපෘති වෙනුවෙන් මුදල් වෙන් කිරීමෙන් අනතුරුව පමණක් නව වැඩ විෂයයන් සඳහා ප්‍රතිපාදන වෙන්කළ යුතුය.

II. 2022 වර්ෂය සඳහා සංවර්ධන ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීමේදි ඔබ විසින් 2021 වර්ෂයට ප්‍රමුඛ සංවර්ධන ව්‍යාපෘති ලෙස ප්‍රමුඛතාගත කළ නමුත් 2021 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ ව්‍යාපෘති කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය.

III. 2022 වර්ෂයේ දි නව කාර්යාල ගොඩනැගිලි සඳහා සැලසුම් සකස් නොකළ යුතු අතර, අත්‍යවශ්‍ය ම වේ නම් ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගැනීමට මා වෙත ඉදිරිපත් කළයුතුය.

IV. වාර්ෂික වියදම් සැලැස්ම කාර්තුමය වශයෙන් සකස් කළ යුතුය.

V. තෝරා ගන්නා ලද සංවර්ධන ව්‍යාපෘති තිරසර සංවර්ධන අරමුණු, ජාතික ප්‍රතිපත්තින්වලට හා එකිනෙක අංශයන්හි ප්‍රමුඛතා කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා නිකුත් කර ඇති අනෙකුත් විවිධ උපදෙස් සමඟ ගැළපිය යුතුය.

VI. තෝරා ගන්නා ලද සංවර්ධන ව්‍යාපෘති සඳහා වැය වන්නා වූ මුළු පිරිවැය ඇස්තමේන්තුව (TEC) නිවැරදිව ඇස්තමේන්තුගත විය යුතු අතර අපේක්ෂිත ප්‍රතිලාභ ජනනය කිරීම සඳහා අමතර ප්‍රතිපාදන පසුව ඉල්ලා නොසිටීමට වගබලා ගත යුතුය. එක් වසරක් තුළ නිම නොවන සංවර්ධන ව්‍යාපෘති පැහැදිලිව සඳහන් කළ යුතුය. 2022 වසර තුළ නිම නොවන ව්‍යාපෘතින් හි මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කළ යුතු අතර, මුළු පිරිවැය ඇස්තමේන්තුව එක් එක් වසර අනුව 10% ක ප්‍රතිශතයකින් වැඩි කළ යුතු අතර, ගිවිසුම් ගත විය යුත්තේ 2022 වසර තුළ අවසන් කළහැකි වැඩ ප්‍රමාණයට පමණක් වන අතර, ගිවිසුම වර්ෂයේ දෙසැම්බර් මස 25 දිනෙන් අවසන් විය යුතුය. මුළු වැඩ කොටස සඳහාම ගිවිසුම් ගත වන්නේ නම් 2022 වසරේ වැඩ කොටස් කාර්තුවට හා වාර්ෂික වැඩ කොටස් පිළිබඳව ගිවිසුමට වගන්ති ඇතුළත් කළ යුතුය. එමෙන්ම, සැලසුම් කිරීමේදී වසර තුළ කෙරෙන ආයෝජනයේ ප්‍රතිලාභ ඉන් ඉක්බිති වසර තුළ ලබාගත හැකි පරිදි ව්‍යාපෘති සැලසුම් කිරීම පිළිබඳව අවධානය යොමුකළ යුතුය.

VII. යෝජිත සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජිත ස්ථානයේ ඉඩම් නිරවුල් කර තිබිය යුතු අතර, සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ සියලු නීත්‍යානුකූල තත්ත්වයන් සම්පූර්ණ කර තිබිය යුතුය. (All types of clearance)

VIII. 2022 වසර සඳහා යෝජිත සංවර්ධන සැලැස්ම මුදල් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම සඳහා මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍ර අංක 3 (Form 3) ආකෘති පත්‍ර අංක 3a (Form 3a) හා ආකෘති පත්‍ර 04 (Form 4) භාවිතයට ගත යුතුය. මෙහිදී අනුරාධපුර සහ පොලොන්නරුව දිස්ත්‍රික්ක දෙක සඳහා නියමිත පරිදි ප්‍රතිපාදන වෙන්වී තිබිය යුතුය.

IX. තම අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය යටතේ ක්‍රියාත්මක කිරිම සඳහා හඳුනා ගනු ලබන ව්‍යාපෘතිවල ප්‍රමුඛතාවය වැඩි ව්‍යාපෘතියේ සිට ප්‍රමුඛතාවය අඩු ව්‍යාපෘතිය දක්වා ප්‍රමුඛතාවය හඳුනා ගැනීමෙන් අනතුරුව මීට අමුණා ඇති ආකෘති අංක 01 අනුව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත යවා අනුමැතිය ලබා ගැනීම සිදුකළ යුතුය.

X. තම අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනයට ඉදිකිරිම් ව්‍යාපෘති සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනය යොදාගෙන ඉටු කිරිමට අපේක්ෂිත ව්‍යාපෘති විස්තර ප්‍රමුඛතාවය අනුව පෙළගස්වා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වෙත මීට අමුණා ඇති ආකෘති අංක 02 අනුව පිටපත් 03 කින් දැනුම් දී ප්‍රමුඛතාවය අනුපිළිවෙළට අවශ්‍ය ව්‍යාපෘති සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු සහ ලංසු ලේඛන සකස් කරවා ගැනීමට කටයුතු කිරිම කළ යුතුය. ඉංජිනේරු ඇස්තමේන්තු සහ ලංසු ලේඛන සකස් කර, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් එම තොරතුරු ආකෘති අංක 03 අනුව ලේඛනයක සටහන් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. (මෙමඟින් ප්‍රතිපාදනය ඉක්මවා ඇස්තමේන්තු සකස් නොකරන බව තහවුරු කරගත හැකිවනු ඇත.) එක් එක් අමාත්‍යාංශයට, දෙපාර්තමේන්තුවට ලැබී ඇති ප්‍රතිපාදන ඉක්මවා ඉංජිනේරු ඇස්තමේන්තු සකස් නොකළ යුතු අතර, එසේ ඉල්ලීම් ලැබෙන අවස්ථාවන්හිදී පෞද්ගලිකව මා දැනුවත් කළ යුතුය.

XI. ඇස්තමේන්තු කිරීම සඳහා මුලින්ම යැවිය යුත්තේ වැඩි වටිනාකම් සහිත ව්‍යාපෘති වන අතර, අඩු වටිනාකම් සහිත ව්‍යාපෘති අවසානයට යැවිය යුතුය.

XII. ඇස්තමේන්තු ලද විගස නියමිත ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කර, ව්‍යාපෘති පිරිනැමීම සිදුකර, කඩිනමින් ව්‍යාපෘති අවසන් කළ යුතුය.

XIII. සෑම අරමුදල් ප්‍රභවයකටම අදාළව ව්‍යාපෘති හඳුනාගැනිමේ මූලික අදියරේදී සෘජුවම පළාතේ ජනතාව වෙත ප්‍රතිලාභ ලැබෙන, පළාතේ සංවර්ධනයට දායක කර ගත හැකි සහ පළාතේ නිෂ්පාදනය වැඩි කිරිමට දායක වන ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

XIV. රේඛීය අමාත්‍යාංශවලින් ලබාදෙන ප්‍රතිපාදන හා වෙනත් මූල්‍ය ප්‍රභවයන් මඟින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය අවශ්‍ය නොවන බැවින් එම ව්‍යාපෘති කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතු අතර, ඉදිකිරීම්වලට අමතරව අනෙකුත් සියලුම ව්‍යාපෘති මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලද පසුව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත යවා අනුමැතිය ලබාගෙන වර්ෂය ආරම්භයේදීම ක්‍රියාත්මක කිරීම කළ යුතුය.

XV. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2022.01.15 දිනට පෙර ඉදිරිපත් කළ යුතු අතර එහි දී ප්‍රසම්පාදන සැලැස්මේ මුල් කාර්තුවට ඇතුළත් කළයුත්තේ එම කාර්තුව තුළ ඉටුකළ හැකි මිල දී ගැනීම් ආදී විෂයයන් වේ. ප්‍රසම්පාදන සැලැස්ම 2022.06.30 දිනෙන් අවසන් විය යුතු අතර, ජුනි 30 දිනට පසුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කරන්නේ නම් ඒ සඳහා අමාත්‍යාංශ ලේකම් මඟින් කරුණු දක්වා මා වෙතින් අනුමැතිය ලබාගත යුතුය. එසේ වුව ද වාර්ෂික සංවර්ධන සැලැස්මෙන් පරිබාහිරව ලැබෙන ප්‍රතිපාදන මෙන්ම විවිධ බාහිර ලැබීම් (රේඛීය අමාත්‍යාංශ ව්‍යාපෘති) සම්බන්ධයෙන් මෙම වගන්තිය අදාළ නොවන අතර, එම ව්‍යාපෘතීන් ද ඒ ඒ ව්‍යාපෘතීන් ප්‍රමාණය අනුව හැකිතාක් කඩිනමින් ප්‍රසම්පාදන කටයුතු අවසන් කළ යුතුය.

2022 වර්ෂයේ සියළු සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව මෙහෙයුම්කරණ ක්‍රියාවලිය 2018.11.09 දිනැති පළාත් සැලසුම් චක්‍ර ලේඛ අංක 2018/01ට අනුව නොකඩවා සිදු කළ යුතුය. එමෙන් ම සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ හඳුන්වා දුන් පරිගණක මෘදුකාංගය මඟින් ප්‍රගතිය වාර්තා කිරීම කළ යුතු අතර, ඒ සඳහා වගකිව යුතු නිලධාරියෙකු වෙත වගකීම පවරා මා වෙත වාර්තා කළ යුතුය.

එල්.ජේ.එම්.ජී.චන්ද්‍රසිරි බණ්ඩාර,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

ආකෘති අංක 01

**<u>අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ව්‍යාපෘති අනුමැතිය ලබා ගැනීම</u>**

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්),
පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව
උතුරු මැද පළාත.

1.වැය ශීර්ෂ අංකය - (උදා - 610)

2.වැය ශීර්ෂ විස්තරය - (උදා- ප්‍රධාන අමාත්‍යාංශය)

3.වැය විෂය අංකය - ...........................................................................

4.වැය විෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදනය - රු. ......................................

5.

| ප්‍රමුඛතා අනුපිළිවෙල අංකය | ව්‍යාපෘතියේ නම | අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ග්‍රාම නිලධාරී කොට්ඨාශය | ප්‍රවේශ විය හැකි ආකාරය (මාර්ගය) | වෙන් වූ ප්‍රතිපාදන (රු.) | 2022 වර්ෂයට අපේක්ෂිත වටිනාකම |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 4 | | | | | | |

(අදාල වැය ශීර්ෂයට වෙන් කර ඇති ප්‍රතිපාදනය නොඉක්මවන පරිදි ව්‍යාපෘති අනුමත කර ගත යුතු වේ.)

පහත සඳහන් ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

අත්සන - අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානී

නිල මුද්‍රාව -

දිනය -

---

අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානී

මේ සමඟ ඇති ඇමුණුමට අනුව ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දෙමි. පහත කරුණු මත අනුමැතිය ලබා දිය නොහැකි බව දැනුම් දෙමි.

අත්සන - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්),

නිල මුද්‍රාව -

දිනය -

(පිටපත් 03ක් සකස් කළ යුතුය.)

ආකෘති අංක 02

**<u>අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ඇස්තමේන්තු ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීම</u>**

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු),
පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව
උතුරු මැද පළාත.

පහත දක්වා ඇති ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කර මා වෙත ඉදිරිපත් කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව - ..........................................................................................
වැය විෂය අංකය හා විස්තරය - ..........................................................................................
වෙන් වූ මුළු ප්‍රතිපාදනය - ..........................................................................................
ඇස්තමේන්තු සඳහා ඉදිරිපත් කරන ව්‍යාපෘතිවල ප්‍රතිපාදන වටිනාකම - ........................................

| ප්‍රමුඛතාවය අනුව අංකය | ව්‍යාපෘතිය අනුමත අංකය | ව්‍යාපෘති විස්තරය | පිහිටි ස්ථානය ප්‍රා.ලේ. කොට්ඨාශය | ප්‍රතිපාදන වෙන් වූ වැය විෂයය අංක | වෙන්වූ ප්‍රතිපාදනය | ඇස්තමේන්තු වටිනාකම | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | |
| 2 | | | | | | | |

2.වසර තුළ නිම කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතියක්ද? අදියර වශයෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක්ද? ...
3.ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අදාල නීතිමය බාධා පවතීද? ........................................................
4.තොරතුරු ලබා ගැනීමට නම් කරනු ලබන නිලධාරියාගේ නම හා ලිපිනය - ..................................
5.වෙනත් තොරතුරු - ..........................................................................................

අත්සන - අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානී
දිනය -
නිල මුද්‍රාව -

---

ප්‍රාදේශීය ඉංජිනේරු - ..........................................................................................
ඉහත ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු හා ලංසු ලියවිලි සකස් කර කඩිනමින් ඉදිරිපත් කර භාර දීමට කටයුතු කරන්න.

අත්සන - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු),
දිනය -
නිල මුද්‍රාව -

(පිටපත් 04ක් සකස් කළ යුතු අතර, ඉන් පිටපත් 03ක් නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) වෙත ද එක් පිටපතක් ගොනුවට ද ඇතුළත් කළ යුතු අතර, නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) විසින් එක් පිටපතක් අදාල ආයතනයට ආපසු යැවිය යුතුය.

ආකෘති අංක 03

# <u>ඇස්තමේන්තු ලේඛනය</u>

පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාත.

අමාත්‍යාංශය - ...................................................................

දෙපාර්තමේන්තුව - ...................................................................

වෙන්ව ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු. - ........................................

| ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු ඉල්ලීම ලැබුණු දිනය | යොමු කළ අය | යොමු කළ දිනය | සකස් කරන ලද ඇස්තමේන්තුව කාර්යාලයට ලැබුණු දිනය | අමාත්‍යාංශයට/ දෙපාර්තමේන්තුවට ආපසු යැවූ දිනය | වටිනාකම රු. | ප්‍රතිපාදන ඉතිරිය රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |